# අනුලා විද්‍යාලයීය පාසල් පවුල් ඒකකය

## අවසාන වාර පරීක්ෂණය 2012

### ගණිතය

| 7 ශ්‍රේණිය | කාලය පැය 02 |
|---|---|

නම/විභාග අංකය : ...........................................

**1 කොටස**

◆ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) සුළු කරන්න. $1\frac{3}{5} + \frac{2}{5}$

(02) 

21 cm ක් දිග කම්බියකින් සමපාද ත්‍රිකෝණයක සැකිල්ලක් සාදා ඇත. එහි පාදයක දිග සොයන්න.

(03) 4756 හි ඉලක්කම් දර්ශකය කීයද?

(04) DEMATAGODA යන වචනයේ අකුරු කුලකයක් සේ ලැයිස්තුගත කරන්න.

(05) සුළු කරන්න. $3x + 2y - 3x + y$

(06) $\frac{2}{5}x$ යන වීජීය පදයේ සංගුණකය කුමක් ද?

(07) 0.7 ප්‍රතිශතයක් ලෙස ලියන්න.

(08) $(-8) + 5$ හි අගය සොයන්න.

(09) $\frac{2}{7}$ ට තුල්‍ය භාගයක් ලියන්න.

(10) පෙට්ටියක රතු පැන් හා නිල් පැන් 60 ක් 2 : 3 අනුපාතයට අසුරා ඇත. රතු පැන් සංඛ්‍යාව කීය ද?

(11) ග්‍රෑම් 8.3 ග්‍රෑම් හා මිලිග්‍රෑම්වලින් දක්වන්න.

---

(12) සෘජුකෝණාස්‍රයක පරිමිතිය 18 cm කි. එහි දිග හා පළල සඳහා අගය යුගලයක් ලියන්න.

---

(13) හිස්තැනට සුදුසු සංඛ්‍යාව ලියන්න.

$7^2$ = ..... x ......... = ..............

---

(14) පොල්තෙල් ජලය මත පාවීම යන සිදුවීම විය හැකියාවට 0 - 1 පරිමාණයට ලබාදිය හැකි ලකුණ කුමක් ද?

---

(15) ඔයිලර් සම්බන්ධය ලියා පෘෂ්ඨ 6 ක් සහ ශීර්ෂ 8 ක් ඇති ඝන වස්තුවක දාර ගණන සොයන්න.

---

(16) සමාන්තර රේඛා ඇඳීමේ දී භාවිතා කළ උපකරණ 2 ක් ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

---

(17) එකතු කරන්න.

| | දින | පැය |
|---|---|---|
| | 8 | 20 |
| + | 3 | 11 |
| | | |

---

(18) 


දී තිබෙන වෘත්තයේ AB හා BC හඳුන්වන නම කුමක් ද?

AB = ................ BC = .................

---

(19) 3, 4, 6 සංඛ්‍යාවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

---

(20) ගීතා බීම බෝතලයකින් 3/4 ක් පානය කළා ය. ඇගේ නංගී එම වර්ගයේ බීම බෝතලයකින් 0.6 ක් පානය කළා ය. බීම වැඩිපුර පානය කළේ කවු ද?

## II - කොටස

♦ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) ජ්‍යාමිතික තල රූප ආශ්‍රිතව ඔබ විසින් පන්ති කාමරයේ දී කරන ලද ක්‍රියාකාරකම මතකයට නගා ගන්න.

(i) එහි දී ඔබ පන්තියට එම ක්‍රියාකාරකම ඉදිරිපත් කරන ලද්දේ කුමන ආකාරයෙන් ද? (ලකුණු:01)

(ii) අවශ්‍ය නිර්මාණය කිරීම සඳහා ගුරුභවතා විසින් විශේෂිත ද්‍රව්‍ය උපයෝගී කරගන්නා ලෙස උපදෙස් දෙන ලදී. එම ද්‍රව්‍ය කුමක් ද? (ලකුණු:01)

(iii) රූපය ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.
පිළිතුරක් නොමැති කොටු පාට කරන්න.




To download past papers visit www.vajirapani.blogspot.com

(ලකුණු:04)

| | සුළු කෝණික ත්‍රිකෝණ | මහා කෝණික ත්‍රිකෝණ | සෘජුකෝණික ත්‍රිකෝණ |
|---|---|---|---|
| සමපාද ත්‍රිකෝණ | .............................. | .............................. | .............................. |
| සමද්විපාද ත්‍රිකෝණ | .............................. | .............................. | .............................. |
| විෂම පාද ත්‍රිකෝණ | .............................. | .............................. | .............................. |

(iv) බහුඅස්‍ර වර්ගීකරණයේ ප්‍රධාන ආකාර ලියා උදාහරණ එක බැගින් අඳින්න. (ලකුණු:03)

(v) පාද හතරක් සහිත සවිධි බහුඅස්‍රයකට උදාහරණයක් දෙන්න. (ලකුණු:02)

(vi) ශුද්ධ ටෙසලාකරණයක් පෙන්වීමට නිර්මාණයක් කරන්න. (ලකුණු:03)

(vii) ටෙසලාකරණයේ දී සියලු ම ජ්‍යාමිතික හැඩතල හමුවන ස්ථානය කුමක් ද? (ලකුණු:02)

(02) (i) පෑනක මිල රු. [illegible] බැගින් පෑන් 3 ක් මිලදී ගැනීම සඳහා රු. 60 ක් වැය විය. මේ සඳහා සමීකරණයක් ගොඩනගන්න. (ලකුණු:02)

(ii) (a) $x + 2 = 6$ සමීකරණය ගැලීම් සටහනක නිරූපණය කරන්න.

(b) එහි ප්‍රතිලෝම ගැලීම් සටහන හා අනුරූප ප්‍රතිලෝම ගැලීම් සටහන ඇසුරින් විසඳුම ලබාගන්න. (ලකුණු:03)

(iii) $a$ ට $b$ හි තුන්ගුණය එකතු කළ විට $C$ ලැබේ. මේ සඳහා සූත්‍රයක් ගොඩනගන්න. (ලකුණු:02)

(iv) $x + 3 > 5$ අසමානතාවය විසඳන්න. (ලකුණු:02)

(v) ඉහත (iv) හි විසඳුම සංඛ්‍යා රේඛාවක නිරූපණය කරන්න. (ලකුණු:02)

(03) (i) 45328 4 න් බෙදේද හේතුව ලියන්න. (ලකුණු:02)

(ii) සංඛ්‍යාවක් 6 න් බෙදේ දැයි බෙදීමෙන් තොරව පරීක්ෂා කරන්නේ කෙසේ ද? (ලකුණු:02)

(iii) 1324 9 න් බෙදේ ද? ඔබේ පිළිතුරට හේතුව ලියන්න. (ලකුණු:02)

(iv) 18 සහ 21 හි මහාම පොදු සාධකය සොයන්න. (ලකුණු:03)

(v) 36 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න. (ලකුණු:02)

බල වශයෙන් ද දක්වන්න.

(04) (i) 4 cm ක අරයෙන් යුත් වෘත්තයක් අඳින්න. (ලකුණු:02)

(ii) එම වෘත්තය සමාන කොටස් 6 ට බෙදන්න. (ලකුණු:02)

ඡේදන ලක්ෂ්‍යය A, B, C, D, E, F යනුවෙන් නම් කරන්න. (ලකුණු:02)

(iii) A, B, C, D, E, F යා කර බහුඅස්‍රය ලබාගන්න. (ලකුණු:01)

(iv) ලබාගත් බහු අස්‍රයේ පාදයක දිග මනින්න. (ලකුණු:02)

(v) එහි අභ්‍යන්තර කෝණයක අගය මනින්න. (ලකුණු:02)

(vi) ලබාගත් රූපය හඳුන්වන නම කුමක් ද? (ලකුණු:02)

(05) රූපයේ දක්වෙන්නේ සෘජුකෝණාස්‍ර 2 කි.




(a) විශාල සෘජුකෝණාස්‍රයේ දිග 10 cm හා පළල 8 cm වේ.

කුඩා සෘජුකෝණාස්‍රයේ දිග 9 cm හා පළල 7 cm වේ.

(i) විශාල සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සොයන්න. (ලකුණු:02)

(ii) අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය සොයන්න. (ලකුණු:02)

(b) (i) දිග 5cm, පළල 3cm, උස 1.5 cm පෙට්ටියක පරිමාව සොයන්න. (ලකුණු:03)

(ii) ධාරිතාව 250 ml වූ කුප්පියකින් ලොකු බෝතලයක් හතර වාරයක දී පිරවිය හැක. ලොකු බෝතලයේ ධාරිතාව මිලිලීටරවලින් හා ලීටරවලින් ලියන්න. (ලකුණු:02)

(c) (i) එකතු කරන්න.

| | kg | g |
|---|---|---|
| | 8 | 600 |
| + | 2 | 750 |
| | | |

download past papers visit
www.vajirapani.blogspot.com

(ලකුණු:02)

(06) පාසලක 7 ශ්‍රේණියේ ළමුන් පාසලට පැමිණෙන ආකාරය පිළිබඳ කරන ලද විමසීමක දී ලද තොරතුරු පහත වගුවේ දැක්වේ.

| පාසලට පැමිණෙන ආකාරය | ගැහැණු ළමයි ගණන | පිරිමි ළමයි ගණන |
|---|---|---|
| පාසල් වෑන් රථයෙන් | 45 | 40 |
| පාසල් බස් රථයෙන් | 55 | 70 |
| පා ගමනින් | 30 | 20 |
| පෞද්ගලික රථයෙන් | 50 | 35 |

(i) ඉහත තොරතුරු දැක්වීමට සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක් ද? (ලකුණු:02)

(ii) එම ප්‍රස්තාරයේ ඉහත තොරතුරු දක්වන්න. (ලකුණු:02)

(iii) වැඩිම ළමුන් ගණනක් පාසලට පැමිණෙන ආකාරය කුමක් ද? (ලකුණු:02)

(iv) එසේ පැමිණෙන ගැහැණු ළමයි හා පිරිමි ළමයි අතර වෙනස කොපමණ ද? (ලකුණු:02)

(v) එම පාසලේ 7 ශ්‍රේණියේ සිටින ළමුන් ගණන කීයද? (ලකුණු:03)

(07) මේසයක දිග 14 cm කි. පළල 10 cm කි.

(i) සුදුසු පරිමාණයක් තෝරා ගෙන අනුපාතයක් ලෙස දක්වන්න. (ලකුණු:03)

(ii) පරිමාණ රූපය අඳින්න. (ලකුණු:04)

(iii) 20 cm න් 8m දැක්වේ. මෙය පරිමාණයට ලියන්න. (ලකුණු:04)

To download past papers visit
www.vajirapani.blogspot.com